# ශ්‍රී ල නි ප චන්ද්‍රිකාගෙන් ගලවාගැනීම

පසුගිය ඉරිදා පැවැත්වූ ශ්‍රී ල නි ප මධ්‍යම කාරක සභා රැස්වීමේ දී මහින්ද රාජපක්ෂ මහතා හා ජ වි පෙ අතර ඇතිකරගන්නා ලද ගිවිසුම අස්කරගැන්වීමට චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය කටයුතුකරන බවට රාවයක් පැතිරගොස් තිබුණි. ඒ මහත්මිය චීනයේ සිටිය දී ශ්‍රී ල නි ප සම්බන්ධයෙන් සිදුවන දේ දැනගැනීමට නියෝජ්‍ය ඇමතිවරයකු වූ ඩිලාන් පෙරේරා මහතා එහි කැඳවූ බවත් ඉන්පසු ඒ මහතාට යම් උපදෙස් දී ආපසු ලංකාවට එවූ බවත් ඒ සමග පැතිරගිය තවත් ආරංචි විය. ඒ උපදෙස් අතර ශ්‍රී ල නි ප මධ්‍යම කාරක සභා රැස්වීමක් කැඳවීම ද වී යැයි සඳහන්විණි. මේ ආරංචි කෙසේ වෙතත් මධ්‍යම කාරක සභා රැස්වීමේ දී ජ වි පෙ සමග අත්සන්කරන ලද ගිවිසුම ගැන එවැනි කිසිවක් නොසිදු වී ඇති අතර චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය තමාට පක්ෂයේ නායකත්වය යාවජීව ව දැරීමට කරන ලද ඉල්ලීමක් ද ප්‍රතික්ෂෙප කරතිබුණි යැයි සඳහන් විණි.

ඒ තොරතුරු කෙසේවෙතත් කුමාරතුංග මහත්මිය මහින්ද රාජපක්ෂ මහතා ජ වි පෙ සමග ඇතිකරගන්නා ලද ගිවිසුම සම්බන්ධයෙන් එතරම් කැමැත්තක් නොදක්වන ලද බවත් ඒ අහොසිකිරීමට ඇයට අවශ්‍ය වූ බවත් පැහැදිලි ය. ජ වි පෙ සමග පරිවාස ආණ්ඩුවක් තැනීමට කටයුතු කෙළේ ද සන්ධානයක් ඇතිකිරීමට කටයුතු කෙළේ ද නොකර බැරි නිසා මිස ජ වි පෙරමුණට දැක්වූ ඇල්මක් නිසා නො වෙයි. එමෙන් ම මහින්ද රාජපක්ෂ මහතා කෙරෙහි ද ඒ මහත්මියට එතරම් සුහද ආකල්පයක් නැත. රාජපක්ෂ මහතා ජනාධිපති අපේක්ෂකයා ලෙස නම්කිරීම කපන්න බැරි අත සිඹීමක් විය. කුමාරතුංග මහත්මිය හා ඇගේ ඇතැම් නියෝජ්‍ය ඇමතිවරු ඒ මහතා නම්කිරීමක් අපේක්ෂා කෙළේ යැයි කිව නො හැකි ය. එසේ නම් රාජපක්ෂ මහතා හා ජ වි පෙ අතර ඇතිවූ ගිවිසුම අහෝසිකිරීමට කුමාරතුංග මහත්මිය කටයුතු නො කෙළේ ඇයි? එයට පිළිතුරු දෙකකි. අද ශ්‍රී ල නි පක්ෂයෙහි ඇගේ බලය ක්‍රමයෙන් අඩු වීගෙන යෑම එක් පිළිතුරක් වෙයි. එහෙත් එය ආපසුහැරවීමට නොහැකි ප්‍රවනතාවක් යැයි නොසිතිය යුතු ය. කුමාරතුංග මහත්මිය අවසාන අවස්ථාව දක්වා ම පක්ෂය හැසිරවීමට තමාට ඇති බලය රැකගැනීමට කටයුතු කරනු ඇත. ශ්‍රී ල නි පක්ෂය කුමාරතුංග මහත්මියගෙන් රැකගත යුතුව ඇත. අනෙක් පිළිතුර නම් කුමාරතුංග මහත්මිය මෙවැනි ගිවිසුම් හා පොරොන්දු ගැන එතරම් බරපතළ ව නො සිතීම ය.

චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය අඛණ්ඩව ශ්‍රී ල නි පක්ෂයේ රැඳී සිටි අයකු නොවන බව අමතක නොකළ යුතු ය. ශ්‍රී ල නි පක්ෂයේ සිටිය දී වුව ද ඇය කුමාර රූපසිංහ මහතාගේ ජනවේග කල්ලියේ සාමාජිකාවක වූවා ය. රූපසිංහ මහතා ජනවේග කල්ලිය ආරම්භ කෙළේ ශ්‍රී ල නි පක්ෂයේ ප්‍රතිපත්තිවලට පටහැණිව යෑමට ය. බොරු වාමාංශික සටන්පාඨ ඉදිරියට දමමින් රැඩිකල් පාක්ෂිකයන් ආකර්ෂණයකරගනිමින් ඒ මහතා මුල සිට ම බලාපොරොත්තු වූයේ ශ්‍රී ල නි පක්ෂයේ ජාතිකත්ව, එනම් සිංහලත්ව ප්‍රතිපත්ති නැතිකිරීම ය. පසුව ඉන්ටනැෂනල් ඇලට් නම් බටහිර ක්‍රිස්තියානි රාජ්‍ය විසින් මුදල් ලබා දෙන රාජ්‍ය නොවන ආයතනයක ප්‍රධානියා ද වූ ඒ මහතා ආගමෙන් මෙන් ම සංස්කෘතියෙන් ද ක්‍රිස්තියානි වෙයි. යමකු ආගමෙන් ක්‍රිස්තියානි වුව ද සංස්කෘතියෙන් සිංහල බෞද්ධ විය හැකි ය. එවැන්නන් රටට හෝ ජාතියට හෝ ප්‍රශ්නයක් නො වෙයි. අද ප්‍රශ්නය වී ඇත්තේ ජාතිකත්වය පාවාදෙමින් කටයුතුකරන සංස්කෘතියෙන් ක්‍රිස්තියානි වුවන් ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ සුවච කීකරු දාසයන් වූ මොවුහු කසිකබල් මාක්ස්වාදීන්, ලිබරල්වාදීන්, ආදීන් මෙන් ම පුහු පශ්චාත්නූතනවාදීන් ලෙස ද බෙදී සිටිති. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ප්‍රධාන අංග වනුයේ සමාජය අභිබවා පුද්ගලිකත්වය (එකිනෙකාගෙන් වෙන්වීම) මතුවීම, පුද්ගල ඉන්ද්‍රිය පිනවීමට (හැඟීම්වලට වහල්වීමට) හැකිතාක් ඉඩකඩ සැපයීම හා වියුක්ත ප්‍රවාද නිර්මාණය ය. මේ කරුණු මේ ආකාරයෙන් සඳහන් වී ඇත්තේ කිනම් ඉංගිරිසි පොතෙහි දැයි අසන්නා උපන්යේ අනුකාරකයෙක් වෙයි. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ සංකේත වශයෙන් මිචලාංජිලොගෙ ඩේවිඩ් ප්‍රතිමාවත් කොපර්නිකස්ගෙ යැයි බටහිරයන් කියන වියුක්ත සූර්ය කේන්ද්‍රවාදයත් දැක්විය හැකි ය. භාරතයේ තිබූ සූර්ය කේන්ද්‍රවාදය සංයුක්ත එකක් විය. (අද හැඟීම්වලට වහල්වීමට අපට උගන්වන තුට්ටු දෙකේ හිරු පමණක් නොව එනමින් ඇති කසිකබල් මාක්ස්වාදී සංවිධානය ද බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ඒජංතයන් පමණක් ම වෙයි.) බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ප්‍රතිඵලයක් ලෙස පුද්ගලයා ද තමන්ගෙන් වෙන්වන අතර භින්නෝන්මාදය සමාජය විසින් ඇතිකෙරෙන රෝගයක් ලෙස පැතිරෙනු ඇත.

© Prof. Nalin De Silva

අප නිතර කියා ඇති පරිදි වසර පණස්හතරකට ඉහත දී බණ්ඩාරනායක මහතා ශ්‍රී ල නි ප පිහිටුවූයේ ලිබරල් පක්ෂයක් ලෙස ය. එහෙත් වැඩිකල් නොගොස් මෙත්තානන්ද මහතා වැන්නන්ගේ බලපෑම් හේතුකොටගෙන ඒ පක්ෂය සිංහලත්වයේ පක්ෂය බවට පත්විය. එය නැවතත් ලිබරල් පක්ෂයක් බවට පත්කිරීම බටහිරයන්ද ඇතුළු විජාතික බලවේගවල අවශ්‍යතාව විය. ඒ සඳහා දැනුවත් ව ක්‍රියාකළ ප්‍රථම පුද්ගලයා වූයේ කලක් සුනේත්‍රා බණ්ඩාරනායක මෙනෙවියගේ ස්වාමි පුරුෂයා ලෙස කටයුතු කළ කුමාර රූපසිංහ මහතා ය. බණ්ඩාරනායකලා නායකත්වය දුන් පක්ෂයක් නැතිකිරීමට බණ්ඩාරනායකලා ම යොදාගැණුනේ කැලේ නැසීමට කැලේ ගහක් ම යොදාගැනීමේ ප්‍රතිපත්තිය අනුගමනය කරමින් ය. ජනවේගය යනු බොරු වාමාංශික සටන්පාඨ ඉදිරියට දමමින් ශ්‍රී ල නි පක්ෂයේ ප්‍රතිපත්ති වෙනස්කිරීම සඳහා ගන්නා ලද උත්සාහයක් පමණක් විය. මෙහි දෙවැනි අංකය ද රඟදක්වනු ලැබුයේ බණ්ඩාරනායක මහත්මියගේ තවත් බෑණනුවකු වූ විජය කුමාරතුඞ මහතා වීම දෛවෝපගත සිද්ධවීමකි. ඔහු ද බොරු සමාජවාදී ප්‍රතිපත්ති ඉදිරියට දමමින් ශ්‍රී ල නි පක්ෂයේ සිංහලත්ව ප්‍රතිපත්ති වෙනස්කිරීමට කටයුතු කෙළේ ය. අවසානයේ ඔහු පක්ෂය කඩාගෙන ගොස් ශ්‍රී ලංකා මහජන පක්ෂය නමින් පක්ෂයක් පිහිටුවා ගත්තේ ය. ශ්‍රී ල නි පක්ෂයට කොඩිවිනයක් වූයේ ඒ පක්ෂයේ බොරු සමාජවාදී ප්‍රතිපත්ති ය. සිංහල බෞද්ධ පදනමකින් සමාජවාදයක් ගැන කතාකරනු වෙනුවට කසිකබල් මාක්ස්වාදයේ යුදෙව් කතෝලික චින්තනයේ සමාජවාදයක් ගැන පක්ෂයේ මහදැන මුත්තෝ බයිලා කීවෝ ය. මේ මහදැනමුත්තන් සිංහල බෞද්ධ චින්තනයක් මත පදනම් වූ සමාජවාදයක් ගැන කතාකිරීම නට්සිවාදය සමග සංසන්දනයකිරීමට දතකට මැද සිටිනු සිතාගැනීම අපහසු කරුණක් නො වෙයි.

කුමාරතුංග මහත්මිය එක්කෝ පරාජය භාරගනිමින් ජ වි පෙ හා මහින්ද රාජපක්ෂ මහතා අතර ඇතිකෙරුණු ගිවිසුම ගැන කතා නොකරයි. නැතහොත් මෙවැනි ගිවිසුම් ගැන හා පොරොන්දු සම්බන්ධයෙන් ඇය ක්‍රියාකර ඇති ආකාරය ගැන දන්නා  බැවින් නිහඬවෙයි. ඒ කුමක් වුවත් අද කළයුතුව ඇත්තේ ශ්‍රී ල නි පක්ෂය කුමාරතුංග මහත්මියගෙන් බේරාගැනීම ය. එය කිරීමට මහින්ද රාජපක්ෂ මහතා සූදානම් ද? අද ඔහු වටා සිටින ඊනියා බුද්ධිමතුන් කියන ආකාරයට කටයුතුකිරීමෙන් නම් ඒ නොකළ හැකි ය. මේ ඊනියා බුද්ධිමතුන්ට අනුව මෙරට ඒකීය රාජ්‍යයක් වී ඇත්තේ 1815න් පසුව ය. ඒ බ්‍රිතානීන් මුළු රටේම පාලකයන් බවට පත්වීමෙන් පසුව ය. ඔවුන් දන්නේ තමන්ට බටහිරයන් කියා දී ඇති දේ පමණකි. මෙරට එකසේසත් රාජ්‍යයක් අනාදිමත් කාලයක් තිස්සේ පැවති බවත්, එවැනි රාජ්‍යයකට අද කියන නම ඒකීය යන්න බවත් මොවුහු නො දනිති. ඒකීය හෙවත් එක්සේසත් රාජ්‍යයක ප්‍රධානම නිර්නායකයක් වනු ඇත්තේ එහි ව්‍යවස්ථාදායක බලය ඇත්තේ කාහට ද කිනම් සභාවකට ද යන්න ය. පැරණි සිංහල රාජ්‍යයෙහි මුළු රටට ම බලපැවෙත්වන පරිදි ව්‍යවස්ථාව හා නීති රීති පැනවීම රජුගේ හා රාජසභාවෙහි   අනුමැතිය පරිදි සිද්ධවිය. ඒකීය රාජ්‍යයක් විසින් සැපිරෙන නිර්නායක එක්සේසත් රාජ්‍යයක් විසින් ද සැපිරෙයි. මේ උගතුන්ට ස්වාධීනව සිතන්නට බැරිවීම අද මේ රටේ ප්‍රධාන ප්‍රශ්නයක් බවට පත්වී ඇත.

කුමාරතුංග මහත්මිය නැතිව 1994 දී ශ්‍රී ල නි පක්ෂයට ජයගත නොහැකිව තිබුණි යැයි කීම බොරුවකි. එ ජා පක්ෂයේ අවුරුදු 17ක ආණ්ඩුවලින් පසුව ඒ වෙනස්කිරීමට ජනතාවට අවශ්‍ය වී තිබුණි. මහින්ද රාජපක්ෂ මහතා වැනි අය පාද යාත්‍රා හා වෙනත් උද්ඝෝෂණ ඔස්සේ එ ජා ප ආණ්ඩුවට අභියෝගකර තිබුණි. එ ජා පක්ෂයේ පරාජය පිළිබඳ එතරම් ගැටළුවක්  නො වී ය. බටහිරයන් හා ඔවුන්ගෙන් යැපෙන රාජ්‍ය නොවන ආයතන කෙළේ මේ තත්ත්වය දැනගෙන කුමාරතුංග මහත්මිය ක්‍රමයෙන් පක්ෂයේ නායිකාව බවට පත්කිරීම ය. ඒ ඔස්සේ ඔවුහු කුමාරතුංග මහත්මිය ලවාම පක්ෂයේ ප්‍රතිපත්ති වෙනස්කිරීමට ඉටාගෙනසිටියහ. කෙසේවෙතත් කුමාරතුංග මහත්මියට එක් රැයකින් පක්ෂය ද වෙනස්කර ජයග්‍රහණය කරා මෙහෙයවීමේ හැකියාවක් නොතිබුණි. 1994 දී පොදු පෙරමුණ ජයග්‍රහණය කෙළේ කුමාරතුංග මහත්මියගේ ආනුභාවයක් නිසා නොව ශ්‍රී ල නි පක්ෂයට එසේ පරාජයකිරීමේ හැකියාව තිබු බැවින් ය. කුමාරතුග මහත්මිය ශ්‍රී ල නිපයට කර ඇති හානිය අතිමහත් ය. ඇය රටට ද එවැනි මට්ටමක හානියක් කර ඇත. ධනපාල මහතා හදිසියේ ම සාම ලේකම් ධුරයකට පත්කරනු ලැබුයේ නෝර්වේ ඇතුළු බටහිරයන්ගේ මනදොළ සපුරාලීමට ය. විජාතික බලවේගවල මේ සියළු කුමන්ත්‍රණ පරදවා ශ්‍රී ල නි පක්ෂයට නැවතත් පැරණි ප්‍රතිපත්ති ලබාදිය යුතු ය. එහෙත් ප්‍රශ්නය වනුයේ මහින්ද රාජපක්ෂ මහතාට ඒ සඳහා අවශ්‍ය ධෛර්යය තිබේ ද යන්න ය. ශ්‍රී ල නි ප චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියගෙන් ගලවාගැනීමට ශක්තිමත් වැඩපිළිවෙළක් තිබිය යුතු ය.

© Prof. Nalin De Silva